# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2249/19 - 2021 ඔක්තෝබර් මස 13 වැනි බදාදා - 2021.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

07 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය : කේඑච්ඩීඑස්/එල්එන්ඩී/03/ඒසීකිව් /වීඅයිඑල්/5-1.*
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය :එල්ඩී/05/2003/වීර්පී/524.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම අත්කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අටකලන් කෝරළේ පන්තිල් පත්තුව සුළු කොට්ඨාසයේ, යටාගර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අ.ග.පි අංක 27, අතිරේක අංක 17 හි පත්‍ර අංක 20 සහ 2006.01.16 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 309, 311 වශයෙන් පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 9.949 ක් පමණ වන ඉඩම් කොටස.

01. කැබලි අංක 309

ඉඩමේ නම: හැඩවකහේන, තිප්පොලහේන, කුදුරුප්පෙහේන සහ කිරිමඩුවෙ හේන; විස්තරය: අවුරුදු 03 ක් පමණ වයසැති මිශ්‍ර වගාවන් ඇත; හිමිකම් කියන අය: අගලවත්ත වැවිලි සමාගම, අංක 10, ඥානාර්ථ ප්‍රදීප මාවත, කොළඹ 08; ප්‍රමාණය:- හෙක්ටයාර් 6.144.

02. කැබලි අංක 311

ඉඩමේ නම: හැඩවකහේන, තිප්පොලහේන; විස්තරය: අවුරුදු 01 ක් පමණ වයසැති තාවකාලික වගාවන් ඇත; හිමිකම් කියන අය: අගලවත්ත වැවිලි සමාගම, අංක 10, ඥානාර්ථ ප්‍රදීප මාවත, කොළඹ 08; ප්‍රමාණය:- හෙක්ටයාර් 3.8050.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2021.12.13 දින පෙ.ව.10.00 ට කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2021.12.06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

බී.ටී. ගයානි අයි. කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
කහවත්ත.

2021 ඔක්තෝබර් මස 04 වැනි දින,
කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 414

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.